සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023


# චිත්‍ර කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- සැලකිය යුතුයි :- සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- පහත දී ඇති ඡායාරූපය ඇසුරු කරගෙන ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචනය පහත දී ඇති වචන අතරින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.



(ජේතවන, මහසෙන්, පටි ධාතුව, වාහල්කඩ, අඩි 232 ක්, ථූපාරාමය)

1. අනුරාධපුර යුගයට අයත් මෙම නිර්මාණය ............................................ නමින් හඳුන්වා ඇත.
2. මෙය ක්‍රි.ව. 276 - 303 අතර කාලය තුළ රජකළ ............................................ රජු විසින් කරවන ලද නිර්මාණයක් වේ.
3. මෙම ස්ථූපයේ තැන්පත් කර ඇත්තේ බුදුන් වහන්සේගේ ............................................ බව ඉතිහාසයේ සඳහන් වේ.
4. මෙම ස්ථූපයේ සවි ශක්තිය හා අලංකාරය සඳහා සතර දිශාවෙන් ............................................ සතරක් නිර්මාණය කර තිබේ.
5. මෙම ස්ථූපයේ සතර දිශාවෙන් සලපතල මලුවට පිවිසීම සඳහා දොරටු හතරක් ඇති අතර ස්ථූපයේ මුළු උස ............................................ පමණ වේ.

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

6. රූකඩ නිර්මාණය සඳහා යොදා ගන්නා ලද ලී වර්ගයක් වන්නේ,
   i. කොස් ලී
   ii. කරුවල ලී
   iii. රුක්අත්තන ලී
   iv. බුරුත ලී

7. තල්කොළ පැදුරු අතර "කදිරපායි" යනුවෙන් හඳුන්වන්නේ,
   i. පාට පැදුරයි.
   ii. නිදන පැදුරයි.
   iii. උත්සව පැදුරයි.
   iv. අභිචාර පැදුරයි.



(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

8. කඳුරු මල මෝස්තරය දක්නට ලැබෙන්නේ,
 i. මැටි කර්මාන්තයේදී ය.
 ii. ලාක්‍ෂා කර්මාන්තයේදී ය.
 iii. පැදුරු කර්මාන්තයේදී ය.
 iv. පිත්තල කර්මාන්තයේදී ය.


9. ප්‍රාග් ඓතිහාසික සිතුවම් දක්නට ලැබෙන දොරවක ලෙන පිහිටා ඇත්තේ,
 i. යාපනේ දිස්ත්‍රික්කයේ ය.
 ii. රත්නපුර දිස්ත්‍රික්කයේ ය.
 iii. කෑගලු දිස්ත්‍රික්කයේ ය.
 iv. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය.


10. හතරැස් කොටුවේ සෑම මුහුණතකම අටපෙති නෙළුම් මල් සැරසිලි යොදා ඇති දාගැබ වන්නේ,
 i. රුවන් වැලි දාගැබයි.
 ii. ථූපාරාම දාගැබයි.
 iii. රන්කොත් වෙහෙරයි.
 iv. අභයගිරි දාගැබයි.


- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ සටහන් කරන්න.**


11. රූකඩ නාට්‍ය සඳහා පැරණි නූර්ති සහ නාඩගම් ගීත යොදාගෙන ඇත. (   )
12. පද්මනිධි සහ සංඛ නිධි නමින් හඳුන්වන දොරටුපාල රූප දෙක හමුවී ඇත්තේ රුවන්වැලි සෑයෙහි පිවිසුම් දොරටුවෙනි. (   )
13. ස්ථූපයක හතරැස් කොටුව මත ඉදිකර ඇත්තේ කොත් කැරැල්ලයි. (   )
14. මහනුවර යුගයේ නිර්මාණය කරන ලද සිංහල සැරසිලි මෝස්තර වල දක්නට ලැබෙන අන්නාසි මල උද්භිධ මෝස්තර සනයට අයත්වේ. (   )
15. ගල්ලැහැ නමින් හඳුන්වන්නේ පැදුරු විවීම සඳහා යොදාගන්නා ලද පන් වර්ගයකි. (   )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශවලට ගැළපෙන රූපය පහත රූප අතරින් තෝරා එහි ඉංග්‍රීසි අක්ෂරය තිත් ඉරමත ලියන්න.**



A


B


C



D


E

16. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි බිල්ලෑව ලෙනෙන් සොයාගන්නා ලද ප්‍රාග් ඓතිහාසික සිතුවමකි. ............................
17. අනුරාධපුර රුවන්වැලි සෑයේ ඉදිකර ඇති වාහල්කඩකි. ....................................
18. හින්දු කෝවිලේ ඉදිරිපස දක්නට ලැබෙන ගෘහ නිර්මාණ අංගයකි. ....................................
19. රූපවාහිනී මාධ්‍යයේ ජනප්‍රිය වූ කලා අංගයකි. ....................................
20. දුම්බර පැදුරු කලා කර්මාන්තයට අයත් වූ නිර්මාණයකි. ....................................

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 07 - 2023

# චිත්‍ර කලාව

## II කොටස

- පහත දැක්වෙන ''අ'' ''ආ'' සහ ''ඉ'' යන කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් අඳින්න.

''අ'' කොටස (ප්‍රකාශන චිත්‍ර)

1. දොළක දිය නාන පිරිසක්.
2. පොහොය දින පන්සල් භූමියේ පුද පූජා පවත්වන බැතිමතුන්.
3. සීයාගෙන් කතාන්දර අහන ළමුන් පිරිසක්.

''ආ'' කොටස (මෝස්තර චිත්‍ර)

4. මල්, කොළ යොදාගෙන වීත්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
5. වෘත්තාකාර හැඩයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. මූලික වර්ණ සහ ද්විතීක වර්ණ භාවිතා කර තෑගි දවටනයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

''ඉ'' කොටස (ග්‍රැෆික් චිත්‍ර)

7. ළමා කතන්දර පොතකට පිටකවරයක් නිර්මාණය කරන්න. ඊට සුදුසු නමක් යොදන්න.
8. පාසලේ පැවැත්වෙන සාහිත්‍ය උළෙල සඳහා අක්ෂර රූප යොදා ප්‍රචාරක පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. ''ඩෙංගු උවදුර වළකමු'' යන මැයින් පෝස්ටර් චිත්‍රයක් අඳින්න.

(2) WWW.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

(2) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 07 - 2023

# චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

## I කොටස

01. ජේතවන දාගැබ
02. මහසෙන්
03. පටී ධාතුව
04. වාහල්කඩ
05. අඩි 232 කි.
06. ( 3 )
07. ( 3 )
08. ( 4 )
09. ( 3 )
10. ( 3 )
11. ( ✓ )
12. ( ✗ )
13. ( ✗ )
14. ( ✓ )
15. ( ✓ )
16. ( C )
17. ( A )
18. ( B )
19. ( D )
20. ( E )

(2) WWW.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

(2) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න